www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 06 | |
| විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | |
| කාලය / காலம் / Time | පැය 02යි. | |

නම:- ............................................ විභාග අංකය:- ............................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙන ම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා බාර දෙන්න.
- I හා II ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50 ක් වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 ක් වශයෙන් මුළු ලකුණු 100 කි.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් ගීත/ සංවාද ඛණ්ඩ ඇසුරු කරගන්න.

01. (අ) මේ ලෝකේ කවුරු නමුත්
වැඩපල නොකරනවා නම්
තිකන් ඔහේ පුටු පිට ඉඳ
කන්න හොඳත් නෑ

(ආ) මහළු වී සිටියත්
රූවින් අඩු වී සිටියත්
දුප්පත් වී සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්

(ඉ) කොප්පර කොප්පර පිපිඤ්ඤා
පස්ස බැලුවොත් දෙසඤ්ඤා

(උ) ආලෙ බැන්ද මාගෙ රම්‍යවත්
මේ සුනිමල මගෙ දික්තල

(එ) කැත්තක් අරගෙන - වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. "අ" අක්ෂරයෙන් දැක්වෙන ගීතමය දෙබස පවසනු ලබන්නේ,
1. තොප්පි වෙළෙන්දා 2. කුකුල් හාමි 3. කාලගෝල 4. ඉරමාමා



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

02. සිරිත් මල්දමෙහි එන පද්‍ය අයත් අක්ෂරය වන්නේ,

1. ''අ'' 2. ''ඇ'' 3. ''ඉ'' 4. ''උ''

03. ලේන්සු හැංගීම නම් ජන ක්‍රීඩාවට අයත් පද්‍ය දැක්වෙන අක්ෂරය වන්නේ,

1. ''අ'' 2. ''ඇ'' 3. ''ඉ'' 4. ''උ''

04. ''උ'' අක්ෂරයට අයත් වන්නේ,

1. වේදිකා නාට්‍ය ගීත කොටසකි. 2. රබන් පදයකි.
3. ජන ගී කොටසකි. 4. ළමා නාට්‍ය ගීත කොටසකි.

05. රබන් පදයක් ඇතුළත් අක්ෂරය වන්නේ,

1. ''ඇ'' 2. ''ඉ'' 3. ''උ'' 4. ''එ''

- පහත දැක්වෙන ප්‍රකාශයන් හරි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණ ද ප්‍රකාශය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ප්‍රබල සංවාද හා රංග විධාන නාට්‍යයකට අත්‍යවශ්‍ය නොවේ. (...........)
07. අභිනය යනු නාට්‍යයක් ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍ය වේ. (...........)
08. එක් චරිතයක් තුළ ඇත්තේ එක් භූමිකාවක් පමණි. (...........)
09. නළු නිළියන්ගේ හඬ පාලනය සඳහා නිවැරදි ස්වසන ක්‍රියාවලිය ඉතා වැදගත් වේ. (...........)
10. රංග අභ්‍යාස අත්‍යවශ්‍ය වන්නේ නාට්‍ය අධ්‍යක්ෂවරයාට ය. (...........)

- අංක 11 සිට 15 දක්වා (අ) කොටසට අයත් මාතෘකාවට වඩාත් ගැළපෙන සම්බන්ධතාව (ආ) කොටසේ ඇත එය තෝරාගෙන එකිනෙකට යා කොට දක්වන්න.

| (අ) | (ආ) |
|---|---|
| 11. පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය | A - පොලිස් නිලධාරියා |
| 12. වෙළඳ පොළක් | B - වෛද්‍යවරයා |
| 13. රෝහල් වාට්ටුවක් | C - පූජකතුමා |
| 14. රිය අනතුරක් | D - මාළු වෙළෙන්දා |
| 15. පන්සල / දේවස්ථානය | E - විදුහල්පතිතුමා |

- අංක 16 සිට 20 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(ජන කතාවක්, සුරංගනාවිය, ආනුෂංගික අංග, අනුකරණය, තොප්පි වෙළෙන්දා නාට්‍ය, තුන, පහ, හතර ක්ෂණික නිරූපණය)

16. අභිනය කොටස් ................................................ කින් සමන්විත වේ.
17. ................................................ යනු අධිමානුෂ චරිතයකි.
18. රංග ආභරණ අයත් වන්නේ ................................ වලට ය.
19. සත්ව චරිත ද ඇතුළත් ................................ ඇසුරින්
20. ...................................... නිර්මාණය කර ඇත.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

## II කොටස

- පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

1. (i) නාට්‍ය යනු කුමක් ද? (ලකුණු 02)
   (ii) කතාන්දරයක් හා නාට්‍යයක් අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02)
   (iii) ඔබ නරඹන ලද වේදිකා නාට්‍යයක් පිළිබඳ කෙටියෙන් අදහස් දක්වන්න. (නාට්‍යයේ නම, රචක, අධ්‍යක්ෂක, නළු නිළි රංගනය, කතා පුවත යනාදිය....) (ලකුණු 06)

2. (i) අභිනය යනු කුමක්ද යි විමසන්න. (ලකුණු 02)
   (ii) අභිනයට අයත් කොටස් නම් කරන්න. (ලකුණු 04)
   (iii) ඔබ කිසියම් චරිතයක් අනුකරණය සඳහා අභිනය භාවිත කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

3. (i) සෝමලතා සුබසිංහ නාට්‍ය ශිල්පිනිය විසින් රචිත ළමා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) ඉන් ඔබ දන්නා නාට්‍යයක් තෝරාගෙන එයින් සමාජයට ලබාදෙන පණිවිඩය කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)
   (iii) ඉහත ඔබ තෝරාගත් නාට්‍යයෙහි ඇතුළත් කතා පුවත ලියා දක්වන්න. (ලකුණු 05)

4. (i) පුංචි අපට දන් තේරෙයි නාට්‍යයෙහි ඇතුළත් චරිත නම් කරන්න. (ලකුණු 03)
   (ii) ඉන් ඔබ කැමති එක් චරිතයක් කෙටියෙන් හඳුන්වා එම චරිතයට ගැළපෙන ඇඳුම රූප සටහනකින් ඇඳ දක්වන්න. (ලකුණු 07)

5. පහත දැක්වෙන අවස්ථා අතරින් එකක් තෝරාගෙන කෙටි නාට්‍යයකට සුදුසු පෙළක් රචනා කරන්න.
   1. කුරුළු ගෙදර දරු පැටවුන් දොරට වඩින දා
   2. කැලේට රජකු පත් කර ගැනීම.
   3. කපුටාගේ කූඩුවේ බිත්තර දමූ කොහා
   4. කැලේ හැදුණු සුරතල් අලි පැටවකු සර්කස් කණ්ඩායමක් විසින් අල්ලා ගැනීම.
   5. පළගැටියාගේ ගීත නාදය කරච්චලයක් වූ අනෙකුත් සතුන්

   - නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම (ලකුණු 04)
   - සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ලකුණු 08)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk